2021 . 04 . 23 අරුණ

පිටුව 6

# උද්ධමනය ඉහළට

■ නයන තරංග ගමගේ

2021 පෙබරවාරි මාසයේ පැවති සියයට 4.2 මෙරට උද්ධමනය 2021 මාර්තු මාසයේ දී සියයට 5.1 දක්වා ඉහළ ගොස් ඇත.එහිදී ආහාර ද්‍රව්‍යවල උද්ධමනය 2021 පෙබරවාරි මාසයේ දී පැවති සියයට 6.9හි සිට 2021 මාර්තු මාසයේ දී සියයට 8.8 දක්වා ඉහළ ගොස් ඇති අතර ආහාර නොවන කාණ්ඩයෙහි උද්ධමනය 2021 පෙබරවාරි මාසයේ පැවති සියයට 1.9හි සිට 2021 මාර්තු මාසයේ දී සියයට 2.0 දක්වා සුළු වශයෙන් ඉහළ ගොස් තිබේ.

2021 මාර්තු මාසයේ දී ආහාර කාණ්ඩයේ, ප්‍රධාන වශයෙන්, එළවළු, අමු මිරිස්, සහ රතු ළූනු මිල ගණන්වල පහළ යෑමක් දක්නට ඇත. මේ අතර, ප්‍රධාන වශයෙන්, ආපනශාලා සහ හෝටල් උප කාණ්ඩයේ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන්, ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන් හි ඉහළ යෑමක් 2021 මාර්තු මාසයේ දී වාර්තා වී තිබේ.